# සත්තු වත්තට ගිය දිනය අදයි




තිනුලි වික්‍රමරත්න

# සත්තු වත්තට ගිය දිනය අදයි

තිනුලි වික්‍රමරත්න

# සත්තු වත්තට ගිය දිනය අදයි

**කතෘ ප්‍රකාශනයකි.**

**ප්‍රථම මුද්‍රණය 2023 නොවැම්බර්**

- **කතෘන්ගේ වෙනත් කෘති**
- **අමාලියාගේ උපන්දිනය**
- **සිඟිති වැඩ පොත**
- **යාළුවුන පීරාෆ්**
- **වලස් පැංචාට පාඩමක්**
- **පුංචි මගේ සිතුවිලි**
- **සුපුනිට තෑග්ගක්**
- **හඳ ඇල්ලූ හැටි**
- **සතුටින් තෝරමු**
- **ආඩම්බර සමනලයා**

# පිදුම

මට ජීවිතය දුන් මගේ ආදරණීය අම්මාටත්, තාත්තාටත්,

කුඩා කලම මා පුංචි කතුවරියක් කළ

මගේ දෙවැනි අම්මා වූ රංජනී සෙන්දනායක

ආදරණීය ගුරු මෑණියන්ටත්,

දැනට මා ඉගෙනුම ලබන **5**-A පන්තියේ

අමිතා කුමාරිහාමි ආදරණීය ගුරු මෑණියන්ටත්,

"ඔයාට පොත් ගොඩක් ලියන්න පුළුවන් තිනුලි"

කියමින් මා දිරිමත් කළ

ආදරණීය සමන්මලී ගුරු මෑණියන්ටත්,

පරිගණක කරනයෙන් අකුරු සකසා මෙම පොත

නිම කිරීමට මා හට සහයෝගය දුන්

මගේම ආදරණීය අක්කාටත්

මෙම පොත පුදමි.

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියකු සතුටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාවන්ත දැනුමින් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාව යි. එසේනම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හදුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි. එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛනකරණය සහජයෙන් උරුම කරගත් මහාමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොටගෙන ග්‍රන්ථකරණයට යොමු කිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශීය සහිත ලේඛන අංකුර දහස් ගණනනක් වැපිරීමට  ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂී ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයකු වීම හරහා ජීවිතයට එකතු වන වටිනාකම සලකා අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි. **2023** සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කර දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට එක් වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුලින් ලැබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු. මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමව්පියන් ආදී ශිෂ්‍යාවන් සෙසු පාසල්වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමන ලදී.

ශෂිකලා සේනාධීර<br>
විදුහල්පතිනිය<br>
මහමායා බාලිකා විද්‍යාලය<br>
මහනුවර<br>
**2023.11.01**

ඔන්න යාලුවනේ... ඉරිදා දවස කියන්නේ හරිම කලබලකාරී දවසක්. මොකද දන්නවද? අපි කොළඹ විනෝද චාරිකාවක් යන නිසා. ඉතින් අපේ නංගි හරි ආසයි සත්තුන්ට ඒ නිසා අපි හිතුවා සත්තුවත්ත නරඹන්න... ඔන්න අපි උදෙන්ම නැගිටලා, ලස්සනට ඇඳගෙන අපෙ බඩුත් ලෑස්ති කලා. ඔන්න දැන් අපි යන්නයි යන්නේ...





අපි දෙහිවල **zoo** එක ළඟට ඇවිල්ලා නංගි කාර් එකෙන් බැස්සට පස්සේ කිව්වා **'මේ zoo නේ අම්මා'** කියලා ඊට පස්සේ අම්මා හයියෙන් හිනා වුණා... ඉතිං ඊට පස්සේ ඇතුල්වෙන තැන ළඟම අපිව පිළිගන්න හා සතුන් ගැන කියලා දෙන්න හොඳ මාමා කෙනෙක් හිටියා. එයාගේ නම ධම්මික. ඔන්න යාලුවනේ අපි ඉස්සරලාම දැක්කෙ ෆ්ලැමින්ගෝලා දෙන්නෙක්.

පස්සේ අපි මේ දවස්වල ප්‍රවෘත්ති වල දකින සිම්බාවත් දැක්කා. අනේ එයා නම් හරිම හුරතල්!





තුන්වෙනියට නම් අපි දැක්කේ ලස්සනම ලස්සන **zebra** ලා . චූටි නංගිට නම් හරිම සතුටුයි. මොකද, එයා **zebra** ලාට හුගාක් කැමතියි නේ.



දැන් වෙලාව හරියටම උදේ නමය හමාරයි ඊටපස්සේ අපි කෙලින්ම ගියේ මින්මැදුරට ...



ගොඩක් කුටිවල විවිධ පාටින් ලොකු පොඩි මාළු සැහෙන්න හිටියා. අපි ඇති වෙනකන් එවා බලලා සතුටු වුණා.  එතනින් එළියට ආපු අපි ඊලගට කෙළින්ම ගියේ කම්මැලි වලහා බලන්න...



ඊට පස්සේ අපි අයිස්ක්‍රීම් කාලා, ඔරන් ඔටන්ලා බලන්න එයාලත් හරිම ශෝක්.



ඔන්න අපි මීළඟට බලන්න ගියේ ලොකුම ලොකු රයිනෝසිරස්ලා බලන්න. මේ යන අතරමග දැක්කා, ලස්සනම ලස්සන ඉත්තෑවොත්...





ඔන්න අපි ලොකුම ලොකු සිංහයොත් දැක්කා හොඳේ......



නිතරම කෑම සොයන ලොකුම ලොකු පැස්බරෙකුත් අපි දැක්කා.



ඔන්න ඉතිං ඊට පස්සේ, ලොකුම ලොකු කොටියෝ, දිවියෝ ඒ වගේම ලස්සනම ලස්සන ජගුවර්ලත් අපි මේ සත්වෝද්‍යානයේදී දැක්කා.





ඔන්න ඉතින් දැන් නං හොඳටම මහන්සි ඒ වගේම හොඳටෝම බඩගිනියි ඒක හින්දා, අපි අසල තිබෙන ආපනශාලාවකට ගියා, අපේ දිවා ආහාරය ලබා ගන්න.

ඔන්න ඉතිං අපි දවල් කෑම කෑවට පස්සේ අපි ගියා ලොකුම ලොකු ඔටුවෙක් බලන්න. ඒ අසලම හිටපු, ලොකුම ලොකු ජිරාෆ්ලත් අපි බැලුවා. චූටි නංගි නම් ජිරාෆ්ලට කෑමත් දැම්මා.



මෙයාලා නම් හරිම ලස්සනයි.



අවසානෙට අපි මුවෝයි උරගයොයි දැක්කා.



අපි සත්වොද්‍යානය නරඹලා ඉවර උනාට පස්සේ අපි ධම්මික මාමට බොහෝම ස්තුතියි කිව්වා. සත්තු වත්ත නැරඹුමෙන් පසු, අම්මා යෝජනා කළා ‘අපි නෙළුම් කුලුණත් බලමුයි’ කියලා. නංගි, මමයි සතුටින් උඩ පැන්නා...

ඉතිං ඔන්න ඔහොමයි යාලුවනේ
අපේ මේ විනෝද චාරිකාව
අවසන් වුනේ....

යාලුවනේ අපි නැවත හමුවෙමු!



# නිමි!



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයක් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොතපතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවත් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව **2014** වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යාංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදී. ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුළ ගොඩනැගී ඇති ලේඛන සංස්කෘතික නව මාවතකට යොමු කරමින් පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ළඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුණු විද්‍යුත් කෘති රචනා කරන්නට විය. ඒ තුළින් සම්පාදනය වූ මේ විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් දියුණුවට ඉවහල් වන අතරම ඔවුන්ගේ හැඟීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය ප්‍රදර්ශනය කරන කැඩපතකි. මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් හා සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි. දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමායා දියණියන් සමඟ එක්ව විද්‍යුත් කෘතියක් රචනා කර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනනගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු...

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කළ ව්‍යාපෘතියේ නිර්මාපක

0

2023 .11. 01